ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1997 අංක 23 දරන ලංකාවේ සංවර්ධන මූදල් සංස්ථා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 අගෝස්තු මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 යි.    තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1997 අංක 23 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 අගෝස්තු මස 21 වන දින]

එල්. ඩී.–ඕ. 25/96.

### ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 23 දරන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- 165 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) " "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන" යන වචන වෙනුවට " "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන් :

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) ඩීඑෆ්සීසී බැංකුව යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.".

3. (1) (දීර්ඝ නාමයේ හැර) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව" සහ (ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව පිළිබඳව සඳහන් වන) "සංස්ථාව" යන වචන වෙනුවට පිළිවෙලින් "ඩීඑෆ්සීසී බැංකුව" සහ "බැංකුව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය. "ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව" සහ "සංස්ථාව" පිළිවෙලින් "ඩීඑෆ්සීසී බැංකුව" සහ "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව.

(2) යම් දැන්වීමක, දැනුම්දීමක, ගිවිසුමක, නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක "ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව" පිළිබඳව කර ඇති සෑම සඳහන් කිරීමක්ම "ඩීඑෆ්සීසී බැංකුව" පිළිබඳව කරන ලද සඳහන් කිරීමක් වශයෙන් කියවා තේරුම් ගනු ලැබිය යුතු ය.

2—D044996—5,875(97/06)

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1993 අංක 25 දරන පනතින් අවසාන වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ යෙදෙන "ශ්‍රී ලංකාවේ පෞද්ගලික, කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායයන්" යන වචන වෙනුවට "කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායයන්" යන වචන ආදේශ කිරීමෙන් : සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ යෙදෙන "පෞද්ගලික ප්‍රාග්ධනය" යන වචන වෙනුවට "ප්‍රාග්ධනය" යන වචන ආදේශ කිරීමෙන් :

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. 1993 අංක 25 දරන පනතින් අවසාන වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (vii) වන ඡේදයේ යෙදෙන "ශ්‍රී ලංකාවෙහි පෞද්ගලික, කාර්මික, කෘෂිකාර්මික හා වාණිජ ව්‍යවසායයන්ට" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ කාර්මික, කෘෂිකාර්මික හා වාණිජ ව්‍යවසායයන්ට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. 1993 අංක 25 දරන පනතින් අවසාන වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තියේ යෙදෙන "මෙම උපවගන්තිය යටතේ ඇපවන ලද සියලු ණය" යන වචනවල සිට, ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ආරක්ෂා කිරීම.

7. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ පවත්නා වූ ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාවේ සියලු ගිවිසුම්, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර ඩීඑෆ්සීසී බැංකුව විසින් එළඹෙන ලද ගිවිසුම්, එකඟවීම් හෝ වෙනත් සාධන පත්‍ර වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ, විනිශ්චයට භාජනව පවත්නා වූ සියලු සිවිල් නඩු, නඩු හා වෙනත් නඩු කටයුතු ඩීඑෆ්සීසී බැංකුව විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබූ සිවිල් නඩු, නඩු සහ වෙනත් නඩු කටයුතු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාවේ සියලු අයිතිවාසිකම්, බැරකම් සහ බැඳීම් ඩීඑෆ්සීසී බැංකුවේ අයිතිවාසිකම්, බැරකම් සහ බැඳීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(4) යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාවේ වාසියට හෝ ඊට විරුද්ධව යම් අධිකරණයක් විසින් සටහන් කරන ලද සෑම තීන්දු ප්‍රකාශයක්, ආඥවක් හෝ නඩු තීන්දුවක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඩීඑෆ්සීසී බැංකුවේ වාසියට හෝ ඊට විරුද්ධව සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥවක් හෝ නඩු තීන්දුවක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ තීන්දු ප්‍රකාශය, ආඥව හෝ නඩු තීන්දුව ඒ අනුව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.